# ශ්‍රී ලංකාවට අයත් මුහුදේ ගිලී ගිය අපේ උරුමයක් වූ දෙවන ලෝක සංග්‍රාමයට අයත් යුධ නැව්

**නන්දදාස සමරවීර[1] හා රුක්ෂාන් ප්‍රියන්දන[2]**

[1]පර්යේෂණ නිළධාරී මුහුදු පුරාවිද්‍යාඥ, මුහුදු පුරාවිද්‍යා ඒකකය, කොටුව, ගාල්ල. nandadasa@yahoo.com
[2]පුහුණු පර්යේෂණ නිළධාරී, මුහුදු පුරාවිද්‍යාඥ, මුහුදු පුරාවිද්‍යා ඒකකය, කොටුව, ගාල්ල
priyandana@gmail.com

දෙවන ලෝක සංග්‍රාමය පැවති 1939-1945 කාලයේ බ්‍රිතාන්‍ය අධිපත්‍යය විසින් පාලනය කරන ලද ශ්‍රී ලංකාව ආසියානු කලාපයේ පිහිටි වැදගත්ම කේන්ද්‍රස්ථානයක් විය. එම්ගින් බ්‍රිතාන්‍ය ආසියානු යටත් විජිතවල ආරක්ෂක උපායික මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි. දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වීමත් සමග ආසියානු කලාපයේ පිහිටි බ්‍රිතාන්‍යයට අයත් යටත් විජිතයන්හි ආරක්ෂාවට ජපනුන්ගෙන් තර්ජන එල්ල විය. ජපන් ප්‍රහාරක ගුවන් යානා විසින් ඇමෙරිකානු "පර්ල්" වරායට එල්ල කරන ලද ආකාරයේ ප්‍රහාරයක් බ්‍රිතාන්‍යය ගුවන් හා නාවික ක්ෂේත්‍රයන්ට කිනම් මොහොතකදී හෝ එල්ල කිරීමේ හැකියාව පිළිබඳව බියක් පැවතින.

බලාපොරොත්තු වූ පරිදි ම 1942 අප්‍රේල් 05 වන ඊස්ටර් ඉරිදා දින පෙරවරුවේ කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය රාජකීය නාවික හා ගුවන් මධ්‍යස්ථාන ඉලක්ක කර ගනිමින් ජපන් ප්‍රහාරක යානා විසින් ගුවන් ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඉන් අනතුරුව අවස්ථා කිහිපයකදී ම ජපන් ප්‍රහාර වලට මුහුණදීමට බ්‍රිතාන්‍ය සේනාංකවලට සිදුවිය. මින් බරපතල ම ප්‍රහාරය එල්ල වූයේ ත්‍රිකුණාමල වරායට ය. ඒ සඳහා ජපන් මරාගෙන මැරෙන ප්‍රහාරක යානා පවා දියත්කර ලැබ තිබිණි. බ්‍රිතාන්‍යන් විසින් වරාය තුළ නවතා තිබූ නාවික යාත්‍රා දියඹට දියත්කරන ලද අතර ඉන් බොහොමයක් ම ජපන් ප්‍රහාරක යාත්‍රාවන්ට ඉලක්ක විය. ශ්‍රී ලංකාවට අයත් වූ හෝ ඊට ආසන්න මුහුදේ ප්‍රහාරයන්ට ලක්ව ගිලීගිය නාවික යාත්‍රා නවයක් පිළිබඳව සඳහන් වේ. ඒවා නම්, එච්. එම්. එස් ටෙනිඩෝස් (HMS Tenedos), එච්. එම්. එස් හෙක්ටර්( HMS Hector), එච්. එම්. එස් කෝන්වෝල් (HMS Conwall), එච්. එම්. එස් ඩෝර්ෂෙට් ෂයර්( HMS Dorset shire), එච්. එම්. එස් හර්මිස් ( HMS Hermes), එච්. එම්. ඒ. එස් වැම්ෆයර් (HMS Vampire), එච්. එම්. එස් හොලිහොක් (HMS Hollyhock), එච්. එම්. එස් බ්‍රිටිෂ් සාර්ජන්ට්(HMS British sergeant), එච්. එම්. එස් අතල්ස්ටේන්(HMS Athelstan) යන නැව් විය. මෙයින් නැව් තුනක පිහිටීම හඳුනාගෙන ඇති අතර අනෙකුත් නාවික ක්ෂේත්‍රයන් පිළිබිදව හඳුනාගැනීම සඳහා පර්යේෂණ සිදුකරමින් පවතී. මෙම නාවික යාත්‍රා ශ්‍රී ලංකාවට අයත් මුහුදු තීරයේ ගිලීගොස් ඇති නිසා අප රටට අයත් දියයට පිහිටි උරුමයන් ලෙස හිදුනාගනු ලබන අතර අධ්‍යයන හා පර්යේෂණ අතින් මෙන්ම සංචාරක ආකර්ශනය, ආර්ථික වශයෙන් ද වැදගත්වූ ස්මාරකයන් වේ. හඳුනාගෙන ඇති නාවික ක්ෂේත්‍ර කිහිපය අතරින් එච්. එම්. එස් හර්මිස් නෞකාව ලෝකයේ විශේෂ අවධානයට යොමුවූ යාත්‍රාවකි. මෙය ගුවන් යානා ප්‍රවාහනය සිදහා සකස් කරන ලද ලොකයේ මුල් ම නැව් කිහිපයෙන් එකකි.

හර්මිස් නම් ග්‍රීක දෙවියන්ගේ නමින් නම් කරන ලද පළමු වන ලෝක සංග්‍රාම අවසානයේදී නිපදවා දියත් කරනු ලැබූ මෙම යාත්‍රාව 1938 දී ගුවන් යානා ප්‍රවාහනය සිදහා වැඩිදියුණු කරන ලදි. මීටර 182 දිග වූ මෙය අත්ලන්තික් සාගරයේ ද මධ්‍යධරණී මුහුදේ ද චීන මුහුදේ ද බ්‍රිතාන්‍යය සේනාංකවල විවිධ අවස්ථාවල යොදවා තිබුණි. 1939 දෙවන ලෝක සංග්‍රාමය සමගින් කාර්යය

බහුල සේවාවක නිරත වූ හර්මිස් 1941 දී බ්‍රිතාන්‍ය නැගෙනහිර සේනාංකය යටතේ ඉන්දීය සාගරයේ ආරක්ෂක කටයුතු සිදහා යොදවා තිබුණි. 1942 අප්‍රේල් 05 වන දින ජපන් ගුවන් ප්‍රහාරක යාත්‍රා විසින් කොළඹට එල්ල කරන ලද ප්‍රහාරවලින් අනතුරුව ආරක්ෂාව සඳහා ත්‍රිකුණාමලය වරායෙන් පිටතට යාත්‍රා කරමින් පැවතුණි. මඩකලපුවට මදක් ඔබ්බෙන් වූ මුහුදු තීරයේ දී ජපන් ගුවන් ප්‍රහාරවලට ලක් වූ හර්මිස් නෞකාව මද වේලාවකින් ගිලී ගියේ මිනිස් ජීවිත 307ක් බිලි ගනිමිනි. මෙම නෞකාවේ සිටි ඡායාරූප ශිල්පියා නැව ගිලෙන අවසාන මොහොත දක්වා විවිධ අවස්ථා ඡායාරූපගත කිරීමට තරම් නිර්භීත විය. මීටර 57 ක් තරම් වන මුහුදු පතුලේ තැන්පත්ව ඇති හර්මිස් නෞකාව ලෝකය පුරා සිටින කිමිදුම්කරුවන්ගේ බලවත් ආකර්ශනයට ලක්ව තිබෙන ශ්‍රී ලාංකීය උරුමයකි.

එච්.එම්.එස්. හර්මිස් නෞකාවට ආවරණය සපයමින් පරිවාර යාත්‍රාවක් ලෙසින් ඊට ආසන්නව ගමන් කරමින් තිබූ එච්.එම්.ඒ.එස්. වැම්පයර් යාත්‍රාවට ද ජපන් ගුවන් ප්‍රහාරවලින් බේරීගත නොහැකි විය. හර්මිස් නෞකාවට ආසන්නව ම ගිනි ගනිමින් පවතින වැම්පයර්හි දර්ශන හර්මිස් ඡායාරූප ශිල්පියාගේ කැමරාවේ සටහන් විය. එසේ වුවත් පසුගිය දශක කිහිපය පුරාම වැම්පයර් කොතනක ගිලී තිබේදැයි යන්න පිළිබඳ පර්යේෂණ සිදුවෙමින් පවතියි. 2005 වසරේ බටහිර ඔස්ට්‍රේලියානු මුහුදු පුරාවිද්‍යා කෞතුකාගාරය විසින් මහාචාර්ය ජෙරමි ග්‍රීන් මහතාගේ ප්‍රධානත්වයෙන් දුරස්ථ පාලක සංනිවේදන උපකරණ යොදාගනිමින් එච්.එම්.ඒ.එස්. වැම්පයර් නෞකාව සෙවීම සඳහා උත්සාහ ගත්ත ද සාර්ථක ප්‍රතිඵල අත් නොවීය.

ජපන් ප්‍රහාරක ගුවන් හමුදාව කොළඹට එල්ල කරන ලද ප්‍රහාරයේදී එච්. එම්. එස් හෙක්ටර් නෞකාව වරායේ නවතා තිබියදී ප්‍රහාරයට ලක් විය. ගුවන් බෝම්බ ප්‍රහාරය නිසා එය ගිණිබත් විය. ඒත් සමග ම ප්‍රහාරයට ලක්වූ එච්. එම්. එස් ටෙනිඩෝර්ස් වරායේ ගිලීගිය බව සඳහන්වේ.

දෙවෙනි ලෝක සංග්‍රාමයේදී නාසි පාර්ශ්වය වෙනුවෙන් ආසියාවේ ජපාන අධිරාජ්‍ය යුද්ධයට එළඹීමත් සමග සිංගප්පූරුවේ තිබූ බ්‍රිතාන්‍ය බලඇණිය බිඳවැටිණ. එම නිසා ලංකාව සංග්‍රාමෝපායිකව ඉතා වැදගත් විය. බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව වෙනුවෙන් අද්මිරාල් සර් ජෙෆ්රි ලෙයිටන් (Geoffrey Layton) ශ්‍රී ලංකාවේ අණදෙන නිළධාරී තැනට පත් කෙරිනි. බ්‍රිතාන්‍ය නැගෙනහිර සේනාංකවල සමස්ථ අණදෙන නිළධාරී වූයේ සර් ජේම්ස් සොමර්විල් (James Somerville) ය. ජපාන අධිරාජ්‍ය වෙනුවෙන් ඉන්දීය සාගරයේ සංග්‍රාම කටයුතු මෙහෙයවනු ලැබූයේ අද්මිරාල් චුචි නගුමෝ Chuichi Nagumo විසින. බ්‍රිතාන්‍ය නැගෙනහිර සේනාංකවල මෙහෙයුම් මධ්‍යස්ථානය වූයේ මාලදිවයිනට අයත් දූපතක් වූ අඩූ අටොල (Addu Atoll)ය.

දෙවන ලෝක සංග්‍රාමයේදී ගිලීගිය නෞකා බොහෝමයක් ම ස්ථානගතව ඇත්තේ ගැඹුරු මුහුදු පත්ලේ ය. එබැවින් විනෝද කටයුතු සඳහා ස්කුබා(SCUBA) උපකරණ භාවිතා කරමින් කිමිදුම් කටයුතු කරන කිමිදුම්කරුවන්ට ලගාවීමට නොහැකිය. එහෙත් ශ්‍රී ලංකා මුහුදු තීරයේ ඇති එච්. එම්. එස් හර්මිස් මෙන්ම එච්. එම්. එස් බ්‍රිටිස් සර්ජන්ට් ද පහසුවෙන් ලගාවිය හැකි නාවික ක්ෂේත්‍රයකි. එච්. එම්. එස් බ්‍රිටිස් සර්ජන්ට් නෞකාව ද ජපන් ප්‍රහාරයට ලක්ව නැගෙනහිර පාසිකුඩා ප්‍රදේශයේ මීටර් 25 ක් ගැඹුරින් ස්ථානගතව ඇත. මෙම නාවික ක්ෂේත්‍රය ඓතිහාසිකව මෙන්ම ජෛව විවිධත්වය අතින් ද වටිනා ස්ථානයකි. හඳුනාගත් මෙම නාවික ක්ෂේත්‍රයන් කිහිපය හැර දෙවන ලෝක සංග්‍රාමයේදී ජපන් ගුවන් ප්‍රහාරයන්ට ලක් වූ නාවික යාත්‍රා කිහිපයක් ම ශ්‍රී ලංකාවට වයඹ දිග ඇත මුහුදේ ගිලී ගොස් ඇති බව හඳුනා ගෙන තිබේ.

## ආශ්‍රේය ග්‍රන්ථ


Brown, David (1990). Warship Losses of World War Two. Naval Institute Press. ISBN 1-55750-914-X.

Dull, Paul S. (1978). A Battle History of the Imperial Japanese Navy, 1941-1945. Naval Institute Press. ISBN 0-87021-097-1.

Tomlinson, Michael the Most Dangerous Moment: The Japanese Assault on Ceylon 1942, London: William Kimber & Co Ltd, 1976, ISBN 955-564-000-9.

Sri Lanka 2005 the search for HMS Vampire (1942) and the VOC ship Dolfijn (1663), Jeramy Green and Corioli Souter